# තරුණ ක්‍රිස්තියානි සංගම්හී ජාතික සභාව,
# ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් ක්‍රියාත්මක කිරීමට
# <u>මාර්ගෝපදේශකය</u>

## 1. අරමුණ

ත.ක්‍රි.සං ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් ලබාදීමේ පරමාර්ථය වන්නේ අඩු ආදායම්ලාභී පවුල්වල ආදායම් වැඩිකරමින් ඔවුන්ගේ අධිෂ්ඨානයන් සපුරා ගැනීම සඳහා මෙන්ම ඔවුන්ගේ ජීවිතවල වර්ධනය වූ අරමුණු ඇතිකිරීමයි.

මෙම ණය ක්‍රමය අප විශ්වාස කරන්නේ තනි පුද්ගලයකුගේ ජීවිත වෙනස්වීමට හා අධ්‍යාත්මික වර්ධනයට රුකුලක් වීමට තුඩුදෙන කරුණක් බවයි. ඒ අනුව ඒ අය තුල ගුණාත්මක බව හා අධ්‍යාත්මිකත්වය වර්ධනය වන වැඩ සටහන් බන්ධනය විය යුතුයි. මෙය ශුද්ධ ලියවිල්ලේ ඉගැන්වීම වන " යමෙක් මුළු ලෝකයම ලබා ගත්තත් සියදිවි නැතිකර ගත්තොත් ඔහුට කිනම් ප්‍රයෝජනයක්ද ? "(මතෙව් 16:26)හි ඇති වදන් වලින් සනාථ වේ.

## 2. අපේක්ෂාවන්

මෙම ක්‍රමවේදයේ අපේක්ෂාවන් තුන් ආකාරයකින් වේ :

2.1. **මුදල් ලබාදීම** : තමන්ගේ ත.ක්‍රි.සං ප්‍රදේශවල ක්ෂුද්‍ර මූල්‍ය ණය සාර්ථකව කළමණාකරණය කළ හැකි හා මග පෙන්විය හැකි ජාතික මට්ටමේ ක්‍රමවේදයක් සකස් කිරීම.

2.2. **හැකියාවන් ගොඩනැගීම** : ත.ක්‍රි.සං තම සාමාජීය මෙහෙවර ක්‍රමානුකූලව කිරීමට හා අඩු ආදායම්ලාභීන් දරිද්‍රතාවයෙන් හා ණයගැති බවින් මුදවා ගැනීම සඳහා ඔවුන්ගේ සහභාගීත්ව සංවර්ධන ක්‍රම වේදයන් වර්ධනය කිරීම.

2.3. **ක්ෂුද්‍ර ණය පහසුකම්** : හඳුනාගත් පවුල් කුඩා කණ්ඩායම් ක්‍රමයකට පුරුදු කිරීමෙන් ඔවුන්ගේ ඉතිරිකිරීම ඔවුන්ට නැවත උපයෝගී කරන්නට සහ කුඩා ප්‍රමාණයේ ණය පහසුකමින් කුඩා කර්මාන්ත ඇතිකිරීම, නිවසක් තැනීම තම මුදල් ප්‍රශ්න පිටු දැකීමටත් ඉවහල් වනු ඇත.

## 3. ණය ලබා දීමේ මූලික ප්‍රතිපත්ති

ත.ක්‍රි.සං.ක්ෂු.මූ ( **ත.ක්‍රි.සං. ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම්** ) සහ ත.ක්‍රි.සං.ක්ෂු.ණ.ක්‍ර **(ත.ක්‍රි.සං. ක්ෂුද්‍ර ණය ක්‍රමය )** යන ණය ලබා දීමේදී පහත සඳහන් පිලිගත් ප්‍රතිපත්ති අනුගමනය කරයි.

a. **ණය සම්බන්ධයෙන් අදාල ප්‍රතිපත්ති:** ණය පහසුකම් ලබා දීමට හැකිවන්නේ ත.ක්‍රි.සං.ක්ෂු.ණ.ක්‍ර සහ ත.ක්‍රි.සං.ක්ෂු. තිපත්ති වලට අනුව නැවත පොළිය සමග අනුමත කාලය තුල ගෙවීමට හැකිනම් පමණි.

b. **සක්‍යතාවට අදාල ප්‍රතිපත්ති :** ණය ලබාගන්නා පවුල දියුණුවන පරිදි සිදුකරනු ලබන සාර්ථක ව්‍යාපෘති වලට මෙම ණය ලබා දෙනු ලැබේ. පවතින ආදායම් තවත් ඉහළ නැංවීමට ඉවහල්වන සක්‍යතාවයෙන් යුත් ව්‍යාපෘති මෙයට අදාලවේ.

c. **ආදායම් නැංවීමේ ප්‍රතිපත්ති :** අනුමැතිය ලත් කුඩා කර්මාන්ත ව්‍යාපෘති ත.ක්‍රි.සං.ක්ෂු.ණ.ක්‍ර මුදල් මතම පමණක් යැපිය යුතු නැත. අදාල පවුල යම් මුදල් ප්‍රතිශතයක් ආයෝජනය කළ යුතුවේ. සාමාන්‍යයෙන් ත.ක්‍රි.සං.ක්ෂු.මූ.ප 90% ක ණය පහසුකම් ස්ථිර හා ක්‍රියාකාරී කටයුතු සඳහා ලබා දෙනු ඇත. ණය ලබා ගන්නා තැනැත්තා ඉතිරි 10% ලබා දිය යුතු වන අතර ඉන් අඩක් තමන්ගේම ශ්‍රම දායකත්වයක් විය හැකිය.

d. **පොදුජන අපේක්ෂාවන් සඳහා වූ ප්‍රත්පත්ති :** ජීවනෝපායට හා ආර්ථිකයට උපකාරී නොවන ව්‍යාපෘතිවලට ණය පහස්කම් ලබාදෙනු නොලැබේ. ණය පහසුකම් දේශීය සෞඛ්‍ය හා ස්වභාවධර්ම නීතිරීතිවලට යටත්ව ලබාදිය යුතුවේ. **උදාහරණයක්** වශයෙන් දුම්කොළ ආශ්‍රිත ව්‍යාපෘති වලට ණය පහසුකම් ලබා නොදිය යුතුයි. තෝරාගනු ලබන ව්‍යාපෘතිය පළාතේ සාරධර්ම වලට හා ක්‍රියාකාරීත්වයට හානි නොකළ යුතුවේ. **උදාහරණයක්** වශයෙන් මුස්ලිම් ජනයා බහුලව වෙසෙන ප්‍රදේශවල ඌරන් ඇතිකිරීම උචිත නොවේ.

e. **අවාසි දායක අයට උදවු කිරීම සම්බන්ධයෙන් වූ ප්‍රතිපත්ති :** ත.ක්‍රි.සං.ක්ෂු.ණ.ක්‍ර සැමවිටම දරිද්‍රතාවයෙන් පෙලෙන හා කාන්තාවන් ඇතු ත කණ්ඩායම් සහ ශාරීරික සහ මානසික දුබලතාවයෙන් යුත් නමුත් අර්ධ හැකියාවන් සහ හැකියාවන් ඇති අය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරයි.

## 4. ක්‍රමවේදය

ජාතික මට්ටමේදී මෙම වැඩසටහන ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහනක් වන අතර ප්‍රාදේශීය ත.ක්‍රි.සං මට්ටමේදී ක්ෂුද්‍ර ණය වැඩසටහනක් වනු ඇත.

මෙම වැඩසටහන යටතේ ක්ෂුද්‍ර ණය වැඩසටහන් ආරම්භකිරීමට අපේක්ෂාකරන ත.ක්‍රි.සං ණය කණ්ඩායම් අඩු ආදායම් ලාභී පවුල් වෙසෙන ජන සමාජවල ආරම්භ කළ යුතුය. මෙයින් සිදුවනුයේ මුළු ත.ක්‍රි.සං බල ප්‍රදේශය තුලම ණය මුදල් තුනීව පතුරවා හැරීමට වඩා , ඉලක්ක කළ පවුල්වල සමාජීය වෙනසක් තේරුම් ගත හැකිවන පරිදි යෙදවීමයි. කණ්ඩායම් ලෙස ඒකරාශී වී ඉදිරිපත් කරන ණය ඉල්ලුම්පත් සඳහා ජීවනෝපායන් සංවර්ධනය පිණිස පමණක් ණය නිකුත් කෙරේ. මෙම අයදුම් පත් ජාතික ත.ක්‍රි.සං ජාතික සභාවේ සංවර්ධන කමිටුවටවිසින් තක්සේරු කර අනුමත කිරීමෙන් පසු ණය නිකුත් කිරීම ජාතික සභාවට ඉදිරිපත් කරනු ඇත. අනුමත වූ ණය අරමුදල් ත.ක්‍රි.සං මගින් අදාල කණ්ඩායම් වෙත නිකුත් කරනු ඇත. මෙම ණය මනාව කළමණාකරණය කිරීම ත.ක්‍රි.සං වගකීම වනු ඇත.

## 5. කළමණාකරනය හා අධීක්ෂණය

වැඩ සටහන අදියර තුනකින් අධීක්ෂණ ක්‍රමයන් දියත් කරනු ලැබේ.

### 5.1. ත.ක්‍රි.සං.ජා.ස ක්ෂුද්‍ර ණයපහසුකම් (ත.ක්‍රි.සං.ක්ෂු.ණ.ප )

ත.ක්‍රි.සං.ජා.ස ප්‍රාදේශීය මට්ටමේ ණය ක්‍රමවේදයට මූල්‍යාධාර සැපයීම සඳහා ජාතික මට්ටමේ චක්‍රිය අරමුදලක් පවත්වාගන යනු ලැබේ. මෙම වැඩසටහන අධ්‍යාපන සංවර්ධන හා ව්‍යාපෘති කමිටුව මගින් කළමණාකරනය කරනු ලැබේ. සාමාන්‍යයෙන් ත.ක්‍රි.සං ය හරහා මුදල් නිකුත් කරන අතර ත.ක්‍රි.සං නොමැති ස්ථානයක එම වගකීම දැරිය හැකි විශ්වාසය ලබා දිය හැකි වෙනත් ආයතනයක් මගින් සිදුකෙරේ. ත.ක්‍රි.සං.ක්ෂු.ණ මෙම ක්‍රියාවලියට හා අධීක්ෂණ කටයුතු සඳහා උපදෙස් මාලාව සකස් කරයි. ත.ක්‍රි.සං.ක්ෂු.ණ ත.ක්‍රි.සං සංවර්ධන කමිටුව හරහා කරනු ඇත. සංවර්ධන කමිටුවක් නොමැති අවස්ථාවක කැපවීමෙන් කටයුතු කළ හැකි 3 – 4 ක ගිහි අයවලුන්ගෙන් සමන්විත හා මහ ලේකම්ගේ නායකත්වයෙන් යුත් සංවර්ධන කමිටුවක් ඇති කළ යුතුවේ.

### 5.2. ත.ක්‍රි.සං. ක්ෂුද්‍ර ණය සැළැස්ම (ත.ක්‍රි.සං. ක්ෂු.න.සැ)

ත.ක්‍රි.සං. ක්ෂු. මයෙන් උපකාර ලබන සියළුම ත.ක්‍රි.සං එහි ක්‍රියාකාරකම් වල මග පෙන්වීම, සොයාබැලීම හා ක්‍රියාවට නැංවීම ආදී කරුණු කෙරෙහි අවධානය යොමුකරන පිණිස වගකීම් පැවරිය යුතුවේ.

ත.ක්‍රි.සං. ක්ෂු. මූ.ප සඳහා අයදුම් කරන ත.ක්‍රි.සං මෙහි සඳහන් කොන්දේසි සම්පූර්ණ කළ යුතුය.

ක්ෂු. මූ. පහසුකම් ලබන ත.ක්‍රි.සං අදාල කාරණයට පමණක් යෙදවිය යුතු අතර ණය ප්‍රාග්ධන මුදල සහ පොළිය 2% (වාර්ෂික) එකට මාසිකව ජාතික සභාවට ගෙවිය යුතුය.

නැවත ලැබෙන ප්‍රාග්ධන මුදල නව ණය පහසුකම් සඳහා උපයෝගී කරනු ඇත. කිසිදු පසුබෑමකින් තොරව මුදල් ආපසු ගෙවීම් කරන සියළුම ත.ක්‍රි.සං නව ණය පහසුකම් ලබා ගැනීමට සුදුසුකම් ලබයි.

### 5.3. ත.ක්‍රි.සං.ක්ෂුද්‍ර ණය සමිති

ත.ක්‍රි.සං.ක්ෂුද්‍ර ණය සමිති ත.ක්‍රි.සං ණය සමිති හරහා කටයුතු කරයි . ඒවා ක්ෂුද්‍ර ඉතිරිකිරීම් හා ක්ෂුද්‍ර කණ්ඩායම් ලෙස 05-10 දක්වා ණය පහසුකම් ලැබූ අයගෙන් සමන්විත වේ. මෙම සමිති සමූපාකාර ණය සංගමයක් ලෙස හෝ සමාජසේවා සංවිධානයක් ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කරනු ලැබේ. කණ්ඩායමේ සියලුම දෙනා ණය මුදල පිළිබඳ නිරීක්ෂණය කරන අය වන අතර ඒ අය සියලුම දෙනා ණය ආපසු ගෙවීම සඳහා ණය ලබාගත් තැනැත්තාට බල පෑමක් එල්ල කරයි. ත.ක්‍රි.සං.ණ.ක්‍ර යාකාරකම් පිළිබඳ අධීක්ෂණය කිරීම කණ්ඩායම් සාමාජිකයන්ගෙන් සමන්විත මෙම කණ්ඩායම වේ. මෙම සමිතිය අයකරගන්නා පොළී මුදල් වලින් චක්‍රිය අරමුදල තරකර ගත යුතු අතර නව ණය මෙයින් නිකුත් කළ යුතු වන්නේය.

## 6. ණය විස්තර ඇගයීමේ පදනම

මූලික ප්‍රතිපත්තීන් 5 ක් ඇගයීම පිණිස යොදා ගැනේ.

### 6.1. චරිතය

ණය ලබා ගැනීමේ දී විශේෂයෙන් සැලකිල්ලට භාජනය වන කරුණක් නම් එය අදාල තැනැත්තාගේ චරිතය වේ. මින් අඅහස් කරනු ලබන්නේ එම පුද්ගලයාගේ විශ්වාසවන්ත කම, නම්බුව, ණය මුදල නැවත ගෙවන්නට තිබෙන උනන්දුව හා අවශ්‍යතාවය යන ඔහු හෝ ඇය සතු ගුණාංග වේ.

මෙම තත්ත්වය තක්සේරු කිරීම එතරම් පහසු නොවේ. එය පහත කරුණ මත පාදක කළ යුතුය.

a. **මුහුණට මුහුණලා සිදුකෙරෙන සම්මුඛ සාකච්ඡාවන්** : පක්ෂපාතීත්වය අවම කරගැනීම සඳහා මෙම සාකච්ඡාවන් කණ්ඩායමක් විසින් කිරීම වැදගත්වේ

b. කලින් ලබාදුන් සහභාගීත්වය පිළිබඳ හා ආපසු ගෙවීම කරන ලද වාර්තාවන් පරික්ෂා කිරීම .

c. අධ්‍යාපන පසුබිම හා ගතිගුණ ඇතුළු අයදුම් කරුගේ ජීවිත රටාව පිළිබඳ අවබෝධය.

## 6.2. ධාරිතාවය

යෝජිත ව්‍යාපෘතියේ ව්‍යවසායකත්වයේ පැවැත්ම ප්‍රවේශමෙන් තක්සේරු කිරීම මින් අපේක්ෂා කරයි. එහි සක්‍යතාවය සරිලන ශුද්ධ ලාභයක් අදාල වියදම් සහ ණය ගෙවා හමාර වූ පසු ඉපයීමට හැකිවීම තක්සේරු කළ යුතුය. පවුලේ වියදම් සඳහා දායක වීමට ඇති හැකියාව සහ ණය අඛන්ඩව ගෙවීමට ඇති හැකියාව තක්සේරු කිරීම ඉතාම වැදගත්ය. අයදුම් කරුවනට තාක්ෂණිකව මනා සක්‍යතාවයෙන් යුත්, ආර්ථික පැවැත්මක් ඇති සහ මූල්‍යමය ඵලදායිතාවයක් සහිත ව්‍යාපෘති තෝරා ගැනීමට සැමවිටම උපකාරී විය යුතුය.

## 6.3. ප්‍රාග්ධනය

අයදුම්කරු විසින් යම් ප්‍රාග්ධනයක් ව්‍යාපෘති එක් කිරීමට හැකියාව පෙන්විය යුතුයි. යොදවන මුදල ඉතා කුඩා ප්‍රමාණයක් වුවද තමන්ගේ ආයෝජනයක් තිබෙන හෙයින් ඔවුන්ගේ කැපවීම මේ සඳහා ඉතා වැදගත් වන අතර පංගුකාරීත්වයක් ඇතිකරයි.

ඔහුගේ හෝ ඇයගේ දායකත්වය ඉඩමක්, වැඩ කරන්නට හැකි ස්ථානයක්, භාණ්ඩ, මුදල් හා වෙනත් වත්කම් හෝ ශ්‍රම දායකත්වය අදාල වන බවට සැලකිය හැකිය. මෙය ගණනය කර අයදුම්පතට ඇතුලත් කළ යුතුය.

මෙකී තක්සේරුවට වෙළඳපල සොයා බැලීමක් හා සමීක්ෂණයක් ඇතුලත් විය යුතුය. එයින් පසු සඳහන් කර ඇති ව්‍යාපෘති ආදායම සාධාරණ හා පවතින වෙළඳපල අගයනට සාපේක්ෂද යන්න දැනගත හැකිය.

## 6.4. කොන්දේසි

අයදුම්පත් වෙළඳපලේ තත්ත්වය, විය හැකි ව්‍යසන හා ශරීර සෞඛ්‍ය තත්වය හා පවුල් පසුබිම අනුව සැළකිල්ලට භාජනය කළ යුතුවේ

### 6.5. ඇපකරය

අඩු ආදායම් ලාභීන් හට ප්‍රමාණවත් ඇපකරයක් සඳහා තමන් අතර වත්කම් නොමැති විය හැකිය. ඒ අනුව ණය ලබාදීම අන්තර් ඇපකරුවන් එනම් ඇප මත නිකුත් කල හැකිය. එයින් අදහස් වන්නේ මෙම ඇපකරුවක් ණය ලබාගත් තැනැත්තාට ණය මුදල ආපසු ගෙවීමට ණය ගෙවීම් පැහැරහල අවස්ථාවල බලපෑමක් කරන බවයි. එම ඇපකරුවන්ද අයදුම්කරුට යම්කිසි බලපෑමක් එල්ලකළ හැකි අය විය යුතුවේ - **උදාහරණ** :- දෙමාපියන්, ලඟම මිත්‍රයෙක් වැනි බලපෑමක් එල්ල කළ හැකිඅය විය යුතුය.

## 7. මූල්‍ය හා ණය ලබාදීමේ පිළිවෙත

ප්‍රාදේශික ත.ක්‍රි.සං තම ප්‍රදේශ වල ක්ෂුද්‍ර ණය වැඩසටහන් ආරම්භකිරීම පිණිස සංවර්ධන කමිටුව මෙලෙස ක්‍රියාත්මක කළ යුතුය.

7.1. දරිද්‍රතාවය බහුලව තිබෙන සහ අඩු ආදායම්ලාභී ජනාවාස එකක් හෝ දෙකක් තෝරා ගන්න

7.2. නිවස ආශ්‍රිත සමාජ ආර්ථික තත්ත්වය, තරාතිරම, අධිෂ්ඨානය හැකියාවන් හා අවශ්‍ය ණය පිළිබඳ විස්තර කුඩා ණය පහසුකම් විස්තර වාර්තාවක් සකස් කළ යුතුවේ.

7.3. ඉහත කී වාර්තාවට අදාලව මෙම ව්‍යාපෘතිය සම්බන්ධ වීමට සුදුසු අයගේ ලැයිස්තුවක් හා ලාභ ඉපයීමේ ව්‍යාපෘතීන් පිළිබඳ විස්තර සකස් කළ යුතුවේ.

7.4. ව්‍යාපෘතියේ සබ්‍යාතාවය දැනට භාවිතා වන පොදු ආකෘතියට අදාලව සකස් කොට ත.ක්‍රි.සං.ක්ෂු.මූ. ණ පහසුකම් අවධානය පිණිස යොමුකළ යුතුවේ

මූල්‍ය අනුමැතිය ලැබූ අවස්ථාවේ දී ත.ක්‍රි.සං කළ යුත්තේ :

7.5. ත.ක්‍රි.සං.ක්ෂු.මූ.ණය පහසුව අධීක්ෂණය කරන බවටත් එම ණය මුදල් සඳහා වග කියන බවටත් ණය වාරිකය 2% වාර්ෂික පොළිය සමග මාසිකව ගෙවන බවට අදාලව ගිවිසුමක් අත්සන් කළ යුතුය.

7.6. ත.ක්‍රි.සං.ජා.සභාව හා ඒකාබද්ධ අයදුම් කරුවන් හට හැකියාව වර්ධනය කිරීමේ පුහුණු සංවිධානය කළ යුතුය.

7.7. වෙනම ගිණුමක් ත.ක්‍රි.සං නමින් ආරම්භකර ණය ගණුදෙනු පවත්වාගන යා යුතුය.

7.8. සෑම අයදුම් කරුවෙකුටම ණය ගොණුවක් ආරම්භ කළ යුතුය. ණය අයදුම්පත ඇපකරුවන්ගේ විස්තර පැහැදිලිව ගොනු කළ යුතුය. සියළුම විස්තර හා සම්මුඛ සාකච්ඡා විස්තර මෙම ගොණුවට ඇතුලත් විය යුතුය. තවද මෙම ගොනුවේ බැලීමට ගිය අවස්ථා හා නිරීක්ෂණ විස්තර ඇතුළු ආපසු ගෙවීම් සම්බන්ධ විස්තර හා ඒ සම්බන්ධ සාකච්ඡා සම්බන්ධයෙන් වූ විස්තර ගොනු කළ යුතුය.

7.9. ත.ක්‍රි.සං.ක්ෂු.මූ.ප ඉදිරිපත් කර ඇති ආකෘතියට අදාල මාසික වාර්තා එවිය යුතුය

## 8. ණය මුදල් ලබා දීම

ත.ක්‍රි.සං.ක්ෂු.මූ.ණ.ප. තම ණය පහසුකම් යෝජනාවේ පරිදි අදියර දෙකකින් හෝ ඊට වැඩි වාරික වලින් ණය මුදල ලබා දෙයි. නියමිත කාලයට නොගෙවීම , ආපසු ගෙවීමේදී සිදුවන අක්‍රමිකතා හේතුවෙන් ඉදිරි වාරික ලබාදීම අත්හිටුවීමට සිදුවේ.

ඒ ආකාරයෙන්ම ප්‍රදේශික සියළුම ත.ක්‍රි.සං අදියර දෙකකින් ණය මුදල් ලබා දිය යුතුවේ. නියමිත කාලයට නොගෙවීම, ආපසු ගෙවීමේදී සිදුවන අක්‍රමිකතා හා ප්‍රමාදයන් ඉදිරිවාරික නිකුත් කිරීම. අනිවාර්යයෙන්ම අත්හිටුවීමට සිදුවේ.

## 9. අයදුම්කිරීම සඳහා සුදුසුකම්

9.1. අයදුම්කරු ත.ක්‍රි.සං ණය සමිතියේ ලියාපදිංචි සාමාජිකයකු විය යුතුය. සහපත් මූල්‍ය විනයක් සහිත විය යුතු අතර සමිතියට ඇති මාසික මුදල් ගෙවීම්වල කිසිදු හිඟයක් නොතැබිය යුතුය.

9.2. අයදුම් කරුවන් රැකියාවක් නොමැති හා සිය පවුලේ ආදායම රු.25,000.00 වැඩි නොවිය යුතුවේ.

9.3. අයදුම්කරු ව්‍යවසායකත්වය සම්බන්ධව හෝ කුඩා ව්‍යාපාර සැළසුම් කරණය සම්බයෙන් පෙර පුහුණුවක් ලැබීමට කැමැත්ත ප්‍රකාශ කළ යුතුවේ. මෙම පුහුණු ත.ක්‍රි.සං. ජාතික සභාව හා සමග ඒකාබද්ධව සංවිධානය කළ යුතුය. මෙවන් පුහුණු අවශ්‍ය නොවන්නේ නම් ඒ හා සමාන පුහුණු ලබා ඇතිබවට ඔප්පු කළ යුතුය.

9.4. අයදුම්කරු තම වාරිකය නැවත ගෙවීමේ හැකියාව රු. 750.00 වැනි මුදලක් ඉතිරි කිරීමෙන් අයදුම්පතේ සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. එම ඉතිරිකිරීම එකවර දැමූ මුදලක් නොවී කලක් තිස්සේ ඉතිරිකරන මුදලක් හා එම පුද්ගලයාට ඉතිරිකිරීමේ පුරුද්දක් තිබෙන බව සනාථ විය යුතුය.

## 10. ණය ලබාදීම සඳහා වූ කොන්දේසි

10.1. යෝජිත ක්ෂුද්‍ර ආර්ථික ක්‍රියාවලිය පවතින හා ලාභ උත්පාදනය කරන ව්‍යාපාර කටයුත්තක් විය යුතුවේ.ත.ක්‍රි.සං.ක්ෂු.ණ.ක්‍ර ලබාදෙන උපදෙස් අනුව ප්‍රායෝගිකත්වය එහි ස්වභාවය, බලාපොරොත්තුව සහ ණය කාලයට හා මාස 6ක් මතුවට ආදායම් හා වියදම් පිළිබඳ සක්‍යතා වාර්ථාවක් ලබා දීමට කටයුතු කළ යුතුවේ.

10.2. එකම පවුලේ දෙදෙනෙකුට එකවර ත.ක්‍රි.සං ණය ලබාගත නොහැක.

10.3. ත.ක්‍රි.සං.ක්ෂු.මූ.ප තනි පුද්ගල අයදුම්පත් භාරගන්නේ හෝ ඒ පිළිබඳ සලකා බැලීම නොකරයි. තනිපුද්ගල අයදුම්පත් භාරගනු ලබන්නේ කණ්ඩායම් සමාජිකයකු ලෙස ණය සඳහා ඒකාබද්ධව යොමු කළ විට පමණි.

10.4. ත.ක්‍රි.සං ණය සමිතිය ණය ඉල්ලුම්පත් තක්සේරු කර ඉන්පසු නිර්දේශ කර ප්‍රධාන ලේකම් විසින් ඉල්ලුම් කළ යුතුය.

10.5. ත.ක්‍රි.සං ණය සමිතිය කණ්ඩායමක් ලෙස දෙදෙනෙක් හෝ වැඩි සංඛ්‍යාවක් ඒකාබද්දව කරන ව්‍යයසායක ක්‍රියා වලියට නොමසුරු සහයක් හා දිරිගැන්වීමක් ලබාදේ.

10.6. යෝජිත ව්‍යාපාරයට සහ එහි ස්වභාවයට අදාලව ණය මුදල් නිකුත් කිරීමේ සීමාවක් තිබේ.

10.7. කලින් ගිවිසගත් අන්දමට ණය මුදල වාරික වශයෙන් මාසිකව ගෙවිය යුතුවේ.

**ඉංග්‍රීසි පිටපතේ පරිවර්තනයකි.**

**සකස් කලේ, ලියෝ ෆොන්සේකා,සම- සභාපති, සංවර්ධන අධ්‍යාපක හා ව්‍යාපෘති කමිටුව.**